PR/2018/21/S

# ජපන් තානාපති කාර්යාලය

නො 20, ශ්‍රීමත් ආර්.ජී.සේනානායක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව
දු.ක :94-11-269-3831~3, ෆැක්ස් 94-11-269-8629
ඊ මේල්: cultujpn@sltnet.lk

ජූලි 16, 2018

## පුවත්පත් නිවේදනය

## ජපන් චිත්‍රපට උළෙල 2018

ජපන් චිත්‍රපට උළෙල 2018 ජූලි 21 සහ 22 යන දෙදින තුළදී 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 7 හි පිහිටි ජාතික චිත්‍රපට සංස්ථා සිනමා ශාලාවේදී පැවැත්වේ. ජපන් තානාපති කාර්යාලය සහ ජපන් පදනම විසින් ජාතික තරුණ සේවා සභාව, ජාතික චිත්‍රපට සංස්ථාව සහ ලෝක තාරුණ්‍යයේ නෞකාවේ සහභාගීත්ව සංගමය සමග ඒකාබද්ධව මෙම චිත්‍රපට උළෙල සංවිධානය කෙරේ.

මෙවර චිත්‍රපට උළෙල පවුලේ රසාස්වාදය උදෙසා මැනදී නිර්මාණය වුනු ජපන් චිත්‍රපට හතරක් ඉදිරිපත් කරයි. ඒ අතරින් “ඉට්ස් අ බියුටිෆුල් ලයිෆ්” (It’s a Beautiful Life) සත්‍ය කථාවක් පදනම් කරගත් වෘතාන්තයක් වන අතර, “ද කම්ප්ලෙක්ස්” (The Complex) ත්‍රාසජනක චිත්‍රපටයකි. මීට අමතරව ගෝල්ඩන් ඔකෙස්ට්‍රා (Golden Orchestra) නම් වූ හාස්‍යජනක චිත්‍රපටයත්, ටයිම් ඔෆ් ඊව් (Time of Eve) යන ත්‍රිමාණ සජීවීකරණ විද්‍යා ප්‍රබන්ධ චිත්‍රපටයත් තිරගත වේ. මෙම සියලු චිත්‍රපට ජපානයේ මෙන්ම විදේශයන්හිදී පවත්වන ලද සිනමා උළෙල වලදී ඉහළ ආකර්ෂණයන් දිනා ඇත.

මෙම චිත්‍රපට පහත කාලසටහනට අනුව නොමිලයේ තිරගත වේ.

| | | |
|---|---|---|
| ඉට්ස් අ බියුටිෆුල් ලයිෆ් ( It’s a Beautiful Life) | - ජූලි 21 | ප.ව 3.00 |
| ද කම්ප්ලෙක්ස් ( The Complex ) | - ජූලි 21 | ප.ව 5.30 |
| ගෝල්ඩන් ඔකෙස්ට්‍රා ( Golden Orchestra) | - ජූලි 22 | ප.ව 3.00 |
| ටයිම් ඔෆ් ඊව් ( Time of Eve) | - ජූලි 22 | ප.ව 5.30 |

*************************************************************

වැඩි විස්තර සදහා සංස්කෘතික අංශය අමතන්න
දු.ක :94-11-269-3831~3 ( දිගුව- 227)

PR/2018/21/S